**(පහත දැක්වෙන්නේ HNB ඇෂුවරන්ස් පොදු සමාගමේ 2023 සංකලිත වාර්ෂික වාර්තාවේ පිටු අංක 19-21 හි සඳහන් සභාපතිතුමියගේ පණිවුඩයේ සිංහල පරිවර්තනයක් පමණි.)**

## සභාපතිතුමියගේ පණිවිඩය

**හිතවත් පාර්ශවකරුවනි,**

විවිධ වූ අභියෝගයන් මධ්‍යයේ වුව ද 2023 වසරේ HNB ඇෂුවරන්ස් සමූහය විසින් රු. බිලියන 2.5 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර මෙම ලාභය පසුගිය වසරට වඩා 5%ක වැඩිවීමක් පෙන්නුම් කරයි. HNB ඇෂුවරන්ස් (HNBA) සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් (HNBGI) යන සමාගම් දෙකම එක්ව කර්මාන්තයේ වර්ධන අනුපාත ඉක්මවා යමින් අඛණ්ඩව තුන් වැනි වරටත් 2023 වසරේ දී 20%කට වැඩි දළ ලේඛනගත රක්ෂණ වාරික වර්ධන අනුපාතයක් වාර්තා කිරීමට සමත් විය. සමාගම් දෙකම තම වර්ධනයන් මනා ලෙස සනිටුහන් කරමින් ශක්තිමත් ශේෂ පත්‍ර පවත්වා ගැනීමට සමත් වූ අතර තම මධ්‍ය කාලීන අරමුණු සාක්ෂාත් කරගැනීම සාර්ථක ලෙසින් සපුරා ගනිමින් සිටී.

### වගකීම් සීරුමාරු කිරීම

2024 වසර වන විට දී මාගේ වසර 9ක අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ කරන මෙම මොහොතේ දී HNBA සහ HNBGI හි අධ්‍යක්ෂකවරියක සහ සභාපතිනිය ලෙස මගේ සේවා කාලය තුළ ලබා ගැනීමට හැකි වූ ප්‍රගතිය සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදු කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි. සාපේක්ෂ වශයෙන් ක්ෂේත්‍රයට අලුත් සමාගමක් ලෙස එක් වූ HNB ඇෂුවරන්ස් අඛණ්ඩව ඉහළ බර තැබීමක් වාර්තා කරමින් විනිවිදභාවය සහ පරිපාලනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කර නව මාවතක් විවර කර ගනිමින් ප්‍රබෝධමත් සේවා ස්ථානයක් නිර්මාණය කිරීම අපගේ අරමුණ විය. ප්‍රමාණවත් පරිදි ප්‍රාග්ධන ආරක්ෂක මෙවලම් පවත්වා ගනිමින් අවදානම් කළමනාකරණය මනා ලෙස සිදු කිරීමේ විචක්ෂණශීලී ප්‍රවේශයක් ඔස්සේ මෙම වැඩපිළිවෙළ නිර්මාණය කෙරිණ.

ජීවිත රක්ෂණ ව්‍යාපාරය 2015 වසරේ සිට 2023 වසර දක්වා එහි වෙළෙඳපොළ කොටස 5.2% සිට 7.2% දක්වා ඉහළ නංවා ගෙන ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ 2015 වසරේ දී පැවති 3.9%ක වර්ධන වේගය ද, 2023 වසරේ දී 6.6% දක්වා ඉහළ යාමක් සිදු විය. කොවිඩ් -19 වසංගතය සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් ඇති වූ වෙළඳපොළ අභියෝගතා මධ්‍යයේ මෙම සාර්ථකත්වය අත් කරගැනීමට අපට හැකි විය. මෑත කාලයේ දී ඇති වූ මෙවැනි විවිධ වූ අභියෝගයන් මධ්‍යයේ පවා මෙම කාලසීමාව තුළ HNBA සිය පාරිභෝගික පදනම 250,000 සිට 500,000 දක්වා වර්ධනය කර ගැනුණි. HNBGI විසින් 2015 වසරේ දී පාඩු ලබන තත්ත්වයකට පත් වුව ද අද වන විට ස්ථාවර ලාභදායිත්වයක් ලබා ගන්නා තත්ත්වයට පත් වී තිබේ. මෙම ආයතන දෙකම පසුගිය වසර දෙක තුළ තාක්ෂණික වශයෙන් විශාල පරිවර්තනයක් වාර්තා කළ අතර ශීඝ්‍රයෙන් ඩිජිටල්කරණය වූ වෙළඳපොළක් තුළ ශක්තිමත් ස්ථානයක් උරුම කර ගැනීම සඳහා අවශ්‍ය නව පද්ධති ක්‍රියාත්මක කිරීමට මුල පිරිය.

දේශීය වශයෙන් ඉතා ශක්තිමත් හා විශ්වසනීය සන්නාමයක් අත්පත් කර ගත් බැංකුවක අනුබද්ධිත ආයතනයන් ලෙස සහ HNB සන්නාමයේ උරුමය සුරකින්නන් ලෙස, මෙම ආයතන දෙකෙහි ම මූල්‍ය ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා අප විශේෂ අවධානයක් යොමු කළ අතර කේන්ද්‍රීය ආයතනික වටිනාකම් පවත්වා ගෙන යෑමට කටයුතු කළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස පාලනයේ උසස් ප්‍රමිතීන්ට අනුගත වෙමින් කර්මාන්තය තුළ තිරසර වාර්තාකරණයේ ප්‍රමුඛස්ථානය අඛණ්ඩව සනිටුහන් කිරීමට සමත් වීමු.

විශිෂ්ට සේවා ස්ථානයක් නිර්මාණය කිරීම, කාන්තා සවිබල ගැන්වීම, නිෂ්පාදන පරාසය සහ, සන්නාමගත කිරීම මෙන් ම MDRT හි ආකර්ෂණීය ජයග්‍රාහකයින් සංඛ්‍යාව වාර්තා කිරීම මෙහෙයුම්වල විශිෂ්ටත්වයේ සංස්කෘතියක් පෝෂණය කිරීම වෙනුවෙන් අප තුළ ඇති යොමු ව සාක්ෂි දරයි. මීට අමතරව, මූල්‍ය වාර්තාකරණය සඳහා බහුවිධ සම්මාන දිනා ගැනීම තුළින් ආයතනික සන්නිවේදනයේ විනිවිදභාවය සහ විශිෂ්ටත්වය සඳහා අපගේ නොසැලෙන කැපවීම තවදුරටත් සනාථ විය. අපගේ පාර්ශවකරුවන්ට සවිස්තරාත්මක සහ තීක්ෂණභාවයකින් යුතු තොරතුරු ලබා දීමට අපි යොමුවීමු. අනාගතය වෙත සූදානම් කරනු ලැබූ තාක්ෂණය භාවිත කරමින් වෙළඳපොලේ වැඩි කොටසක් අත්පත් කර ගැනීම සඳහා ආයතන ද්විත්වයම ධනාත්මක වර්ධන මාවතක සිටීම ගැන විශේෂයෙන් සතුටු වෙමි. වැදගත්ම දෙය නම්,

HNBA සමූහයේ කාර්ය සාධනය ඉතා ශක්තිමත් මූලිකාංග මත පදනම් වී ඇති අතර කොටස් හිමියන්ට සහ සියලුම පාර්ශ්වකරුවන්ට වටිනාකමක් එක් කරමින් ඉහළ තලයකට ළඟා වීමට සූදානමින් සිටී.

## ශ්‍රී ලංකාවේ ප්‍රතිසාධන මාවත

2023 ප්‍රකෘතිමත් වසරක් වූ අතර එම වසර තුළ දී ශ්‍රී ලංකාවට ප්‍රධාන විචල්‍යයන් ගණනාවක් ස්ථාවර කොට ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය. නව පාදක වර්ෂයකට රට මාරු වීමත් සමඟ, 2023 ජනවාරි මාසයේ 53.2% සිට 2023 දෙසැම්බර් වන විට 4.2% දක්වා උද්ධමනය ස්ථාවර වූ අතර ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ඒ කෙරෙහි විශාල වශයෙන් බලපෑවේය. දින 364 භාණ්ඩාගාර බිල්පත් අනුපාතය 2022 දෙසැම්බර් මාසයේදී 29.27% වූ අතර එය 2023 දෙසැම්බර් වන විට 12.93% දක්වා පහත වැටීමත් සමඟ පොලී අනුපාත ද ස්ථාවර විය. ප්‍රේෂණ සහ සංචාරක ව්‍යාපාරයේ ඇති වූ වර්ධනයන් සමගින් ඩොලර් ද්‍රවශීලතාවය ලිහිල් වූ අතර විනිමය අනුපාතිකය රුපියල් 363.11 සිට රුපියල් 323.92 දක්වා පහළට වැටුණි. ඇඟලුම් අපනයනය (ඇමරිකානු ඩොලර් මිලියන 4,879) අභිබවා යමින් ප්‍රේෂණ 57.5% කින් හෙවත් ඇ.ඩො. මිලියන 5,970 දක්වා වැඩි වූයේ විදේශ විනිමය ඉපැයීමේ ඉහළම මූලාශ්‍රය බවට ප්‍රේෂණ පත් කරමිනි. සංචාරක පැමිණීම් පෙර වසරට වඩා දෙගුණයක් වූ අතර සංචාරක ඉපැයීම් 82% කින් හෙවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 2,068 දක්වා වැඩි විය. වෙළඳ ශේෂය ඇමරිකානු ඩොලර් මිලියන 4,900 දක්වා සුළු වශයෙන් අඩු විය.

2023 ජූනි මාසයේදී දේශීය ණය ප්‍රශස්තකරණය සම්පූර්ණ කිරීම නිසා Fitch ශ්‍රේණිගත කිරීම් සහ S&P ගෝලීය ශ්‍රේණිගත කිරීම් යන දෙකම ඔස්සේ රටේ ණය ශ්‍රේණිගත කිරීම් ඉහළට ගමන් කළේය. බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීම 2024 දී සිදු කළ යුතු ප්‍රධානම කාර්යයක් බවට පත් වී ඇත. රාජ්‍ය මූල්‍ය අංශ වැඩිදියුණු කරමින් 2023 දී බදු ආදායම වැඩි විය. පළමු කාර්තු දෙක තුළ දළ දේශීය නිෂ්පාදිතයේ සෘණ වර්ධනයක් වාර්තා වූ අතර, තුන්වන කාර්තුවේ ධනාත්මක වර්ධනයක් වාර්තා විය. එය සිව්වන කාර්තුවේ දී තවත් ශක්තිමත් කළ යුතු විය. මූලික බලපෑම් පිළිගෙන 2024 වසර වෙත වඩාත් ශක්තිමත් අයුරකින් ගමන් කිරීම දිරිගන්වන සුළු විය.

ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශය 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දළ වාරිකවල 9%ක වර්ධනයක් වාර්තා කළේය. ඉවත දැමිය හැකි ආදායම අඩුවීමත් සමග රක්ෂණයේ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්භාවය වැඩි වීම තුලින් ජීවිත රක්ෂණ ව්‍යාපාරය 12% කින් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 6% කින් ද ඉහළ නැංවීමට සමත් විය. 2023 තුන්වන කාර්තුව වන විට රක්ෂණ නියාමක ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද දත්ත මත පදනම්ව, ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ වර්ධනයක් වාර්තා විය. ඒ හේතුවෙන් මෙම අංශයේ මුළු වත්කම් ද 16% කින් වැඩි විය. ජීවිත රක්ෂණ සමාගම්වල ලාභදායිතාව මෙම කාලසීමාව තුළ සැලකිය යුතු ලෙස වර්ධනය වූ නමුත් ආයෝජන ආදායම වැඩිදියුණු කිරීම සහ හිමිකම් පිරිවැය කළමනාකරණය තිබියදීත් සාමාන්‍ය රක්ෂණ සමාගම්වල ලාභදායිතාව අඩු විය. මෙහි දී අවධානයට ලක් කළ යුතු වැදගත් කරුණක් නම්, ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාත වැඩිදියුණු වීමයි. රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනයෙන් නිර්මාණය වන මුළු වත්කම්වලින් 44% ක ස්වෛරී නිරාවරණයක් මෙම ක්ෂේත්‍රය සතු වේ.

## තිරසාර වටිනාකමක් ලබා දීම

පාර්ශවකරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දීමේ අවශ්‍යතාවය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තර අවධානය යොමු කර ඇත. අපගේ සේවක වටිනාකම් අනුපාතය 2023 වසරේ දී වඩාත් ශක්තිමත් වූ අතර සේවකයන්ගේ තෘප්තිමත්භාවය වඩාත් සුරක්ෂිත වන පරිදි ඔවුන්ගේ යහපැවැත්ම සහතික කිරීමට සුවිශේෂිත අවධානයක් යොමු කිරීමට අප කටයුතු කර ඇත. හැකි සෑම අවස්ථාවකදීම ගැටලුකාරී තත්ත්වයන් විසඳා ගැනීමටත් දුක් ගැනවිලි සඳහා පිළිතුරු ලබා දීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන් පාරිභෝගික පැමිණිලි සහ සමීක්ෂණ ප්‍රතිපල සමාලෝචනය කර ඇත. රුපියල් බිලියන 6.6ක් ප්‍රතිලාභ සහ හිමිකම් ලෙස ගෙවා ඇති අතර තවත් රුපියල් බිලියන 6.3ක් ජීවිත අරමුදලට සපයා ඇත.

අපගේ අලෙවි නියෝජිතයින් සහ බැංකු රක්ෂණ හවුල්කරුවන් ආයතනික වටිනාකම්වලින් සන්නද්ධ කිරීම සඳහා අවශ්‍ය වන පුහුණුව, මෙවලම් සහ තාක්ෂණය ලබා දීමට බොහෝ අංශ ඔස්සේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේ. ක්‍රියාකාරී දුක්ගැනවිලි යාන්ත්‍රණයන් අඛණ්ඩව පවත්වා ගෙන යන අතර ඒවා නිසි පරිදි ආමන්ත්‍රණය කෙරී ඇත්ද යන්න සහතික කිරීම සඳහා සමාලෝචන සිදු කෙරේ. මෙම දුක් ගැනවිලිවලට අදාළ ව ලැබෙන ප්‍රතිපෝෂණ මත පදනම්ව අපගේ විසඳුම් සංවර්ධනය කෙරෙනු ඇත. අප විසින් සපයන ලද වටිනාකම කර්මාන්තයේ දෙවන ඉහළම MDRT ජයග්‍රාහකයින් සංඛ්‍යාව ඔස්සේ පෙන්නුම් කෙරේ.

2022 වසර අවසානයේ රු. 42.90 සිට 2023 අවසන් වන විට රු. 56.60 දක්වා කොටස් මිල 32% කින් වැඩි වීමත් සමඟ ආයෝජකයින් වෙත ලබා දුන් අගය වර්ධනය කිරීමට හැකි විය. 2023 වසර සඳහා යෝජිත ලාභාංශ රු. 3.90 ක් වූ අතර සෑම කොටස් හිමියෙකුටම වසර ආරම්භයේ කොටස් මිල මත පදනම්ව 41% ක ප්‍රතිලාභයක් ලබා දීම සිදු විය. එය මිණුම් සලකුණු පොලී අනුපාතවලට වඩා බෙහෙවින් ඉහළ අගයකි.

## වර්ධනය, ස්ථාවරත්වය සහ ලාභය

HNB ඇෂුවරන්ස් සමූහය තවත් සාර්ථක වසරක් වාර්තා කළේ බදු පෙර ලාභය රුපියල් බිලියන 2.5 ක් බවට පත් කිරීමේ ඉලක්කගත උපායමාර්ගික වැඩපිළිවෙළක් ඔස්සේයි. HNBA විසින් බදු ගෙවීමට පෙර ලාභයෙහි 14%ක වර්ධනයක් වාර්තා කළ අතර එය රුපියල් බිලියන 2.3ක් විය. එම මුදල සමූහයේ බදු ගෙවීමට පෙර සමස්ත ලාභයෙන් 90%ක් වෙයි. විදේශ මුදල් ආයෝජනවලට අදාළ විදෙස් මුදල් ඒකක පරිවර්තනය කිරීමේ දී ඇති වූ පාඩු, පිරිවැය වැඩිවීම සහ අනෙකුත් මෙහෙයුම් වියදම් හේතුවෙන් HNBGI හි ලාභ අඩකින් පහත වැටිණ. විකුණුම් ක්‍රියාවලියේ වර්ධනය, පාරිභෝගික අත්දැකීම් සහ තාක්ෂණික පරිවර්තනයන් ඔස්සේ ඇති වූ වෙනස්කම් දළ ලේඛනගත වාරිකයේ වර්ධනයට මූලික වශයෙන් ඉවහල් විය.

අපගේ නිෂ්පාදනයන් වඩාත් සංකීර්ණ සහ වඩාත් අදාළ වන ආකාරයෙන් වර්ධනය වී ඇත. SupremeHealth Unlimited යනු එවැනි නවතම වර්ධනයන් සඳහා උදාහරණයකි. නවතම ක්ෂුද්‍ර රක්ෂණය, ඊ-ලයිෆ් සහ පශු සම්පත් සහ බෝග රක්ෂණ ක්‍රම ඔස්සේ පාරිභෝගික අංශය පුළුල් වූ අතර සමාගම දේශීය ප්‍රජාවන් කෙරෙහි වඩ වඩාත් සැලකිලිමත් වන බව තහවුරු කෙරිණ. HNBGI විසින් මෝටර් වාහන රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි වැඩි වශයෙන් රඳවා තිබූ අවධානය තව ක්ෂේත්‍ර වෙත ද යොමු කරමින් ආදායම විවිධාංගීකරණය කර ගැනීමට සමත් විය.

HNBA සහ HNBGI යන දෙඅංශයේම ණය ශ්‍රේණිගත කිරීම් ෆිච් (Fitch) ශ්‍රේණිගත කිරීම් අනුව A-(lka) මට්ටම ලබා ඇති අතර කර්මාන්තයේ ඉහළ ම සාධනයක් ළගා කර ගෙන ඇත. එහෙත් මෙම ශ්‍රේණිගත කිරීම් සමස්ත රටෙහි අවදානම් ශ්‍රේණිගත කිරීම ඔස්සේ නිරන්තරයෙන් ඇගයීමට ලක් වෙයි. HNBA විසින් අදාළ වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රමානාත්මතා අනුපාතය 306% සිට 339% දක්වා දියුණු කර ගෙන තිබූ අතර HNBGI හි 239% සිට 208% දක්වා පහත වැටීමක් සලකුණු විය. 120% ක අවම අනුපාතයට සාපේක්ෂව ආයතන දෙකෙහි ශක්තිමත් මූල්‍ය තත්ත්වයන් මේ ඔස්සේ පිළිබිඹු විය. මීට අමතරව, ශක්තිමත් මූල්‍ය ස්ථාවරයක් පිළිබිඹු කරමින් ද්‍රවශීලතා මට්ටම් 2023 දී සෞඛ්‍ය සම්පන්න අගයක් අත්පත් කර ගැනීමට සමත් විය.

## පරිපාලනය සහ නායකත්වය

රවී අබේසූරිය මහතාගේ අකල් අභාවය මෙන් ම අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු ඉල්ලා අස්වීමත්, එක් අධ්‍යක්ෂවරයෙකු විශ්‍රාම යාමත් හේතුවෙන් 2023 වර්ෂයේදී HNBA අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය වෙනස් විය.

වසර 5කට අධික කාලයක් HNBA හි ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළ අභාවප්‍රාප්ත රවී අබේසූරිය, HNBA හි ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස වසර 9ක සේවා කාලයකින් පසු විශ්‍රාම ගිය ආචාර්ය සිවකුමාර් සෙල්ලයිය යන මහත්වරුන් සහ ඩිල්ෂාන් රොද්‍රිගෝ මහතා අධ්‍යක්ෂවරයෙකු ලෙස වසර 11 ක කාලය තුළ HNBA වෙත සිදු කරන ලද සේවය පිළිබඳව මාගේ ප්‍රශංසාව සටහන් කිරීමට කැමැත්තෙමි.

එල් එච් ඒ ලක්ෂ්මන් සිල්වා සහ ආචාර්ය ප්‍රසන්න සංකල්ප ගම්වරිගේ යන මහත්වරුන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සාදරයෙන් පිළිගන්නා අතර ඔවුන් පිළිබඳ වැඩිදුර තොරතුරු මෙම වාර්තාවේ වෙනත් තැන්වල දැක්වෙනු ඇත. ආයතනික පාලන යාන්ත්‍රණයන් සමඟ අනුකූල වෙමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය අවශ්‍ය අවස්ථාවන්හි දී හමු වීමට ඇති පහසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ යහසංස්කෘතිය තහවුරු කරන අතර ඵලදායී බව සහතික කරයි.

ඩිජිටල්කරණය ප්‍රධාන ප්‍රමුඛතාවයක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය හඳුනා ගෙන ඇති අතර තොරතුරු තාක්ෂණ මත පාදක වූ පරිපාලනය කෙරෙහි විශ්වාසය තබා ඇත. අපේක්ෂිත ක්‍රියාකාරීත්වයට සරිලන පරිදි ව්‍යාපෘති නියමිත වේලාවට අවසන් කිරීම සහතික කිරීම ප්‍රධාන න්‍යාය පත්‍ර අයිතමයක් විය. සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ප්‍රගතියක් ලබා ගනිමින් සිටින අතර 2024 වසරේ දී පරිපූර්ණත්වයට ළගා වීමට නියමිතයි.

කොළඹ කොටස් හුවමාරුව ආයතනික පරිපාලනය සම්බන්ධයෙන් නව ලැයිස්තුගත කිරීමේ රීතියක් නිකුත් කර ඇති අතර එයට සම්පූර්ණයෙන්ම අනුකූල වීම සඳහා සංශෝධන සහ වැඩිදියුණු කිරීම් අවශ්‍ය වේ. නිශ්චිත සංක්‍රාන්ති දිනයන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා අප මාර්ග සිතියමක් සකසා ඇති අතර 2024 වසරේ තුන්වන කාර්තුව වන විට සම්පූර්ණයෙන්ම අනුකූල වීමට බලාපොරොත්තු වෙමු. ආයතනික පරිපාලන වාර්තාව මේ සම්බන්ධයෙන් කරුණු විග්‍රහ කර ඇත. 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී ආයතනික පරිපාලනය පිළිබඳ හොඳම භාවිතයන් පිළිබඳ නව සංග්‍රහය නිකුත් කිරීම ද මණ්ඩලය විසින් සටහන් කර ඇති අතර ස්වේච්ඡා පදනමින් ගොඩනගා ඇති මෙම කේතයට අනුකූල වීමේ අරමුණින් විධිවිධාන සමාලෝචනය කෙරෙනු ඇත.

## ඉදිරි දැක්ම

2023 වසරේ 3 වන කාර්තුවේ යම් ආර්ථික අවපාතයක් වාර්තා වූ අතර එය 2024 වසර සඳහා වඩාත් සුපරීක්ෂාකාරී හා සුභවාදී දැක්මක් ඇති කර ගැනීමට සහාය වනු ඇත. ප්‍රේෂණ ආදායම් සමඟ සංචාරක ඉපැයීම් තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. උද්ධමනය, පොලී අනුපාත සහ විදේශ විනිමය අනුපාතවල වැඩි ස්ථාවරත්වයක් ඇති වීමත් සමඟ, උපයෝජ්‍ය ආදායම ස්ථාවර

වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමේ දී ඇති විය හැකි ප්‍රමාදය මෙන් ම මැතිවරණ හේතුවෙන් සංචාරක ව්‍යාපාරයට ඇති විය හැකි බලපෑම් නිසා සිදු විය හැකි අවාසිදායක අවදානම් ද පවතී.

HNB ඇෂුවරන්ස් සමූහය මධ්‍ය කාලීන සැලැස්මේ දක්වා ඇති සිය ගමන් මග වෙනුවෙන් කැපවී සිටින අතර උපාය මාර්ගික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට කැප වී සිටී. ආයතනික සංස්කෘතිය, පුද්ගලයන්, තාක්ෂණය, ක්‍රියාවලි සහ නායකත්වය මෙම සමූහයේ උසස් අභිලාෂයන් කරා ළඟා වීමටත් එහි වර්ධනය සහ වටිනාකම් නිර්මානය කිරීමටත් ඒකාබද්ධ කර ගැනෙනු ඇත.

## ඇගයීම්

HNB ඇෂුවරන්ස් සමූහයේ ක්‍රමෝපායික දිශානතිය හැඩගැස්වීමේදී සහ අධ්‍යක්ෂ මණ්ඩලවල ඵලදායිතාවයට පහසුකම් සැලසීමේදී ඉතා ශක්තිමත් බුද්ධිමය සාකච්ඡා සහ විෂය මූලික අදහස් ඔස්සේ දැක්වූ දායකත්වය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල දෙකට ස්තුතිවන්ත වීමට කැමැත්තෙමි. අදාළ ප්‍රධාන විධායක නිලධාරීන් දෙදෙනාගේ නායකත්වයෙන් යුත් මෙම ආයතනයන් යුගල නව්‍ය ප්‍රවේශයක් සහ අසමසම අධිෂ්ඨානයක් සමඟ විශේෂයෙන් පසුගිය වසර තුන තුළදී කැපී පෙනෙන ප්‍රතිඵල ලබා දීම සඳහා සුවිශාල කැපවීමක් සිදු කළ අතර ජයගත නොහැකි ලෙස පෙනී ගිය දුෂ්කරතා හමුවේ වෙහෙස මහන්සි වී වැඩ කරමින් ඉහළ සාර්ථකත්වයක් ලබා ගෙන ඇත. සමූහ ව්‍යාපාරයේ සභාපතිනිය ලෙස ඔවුන් සමඟ සමීපව කටයුතු කරමින් ඔවුන්ගේ උත්සාහයන්ට පහසුකම් සැලසීම සහ ඔවුන්ගේ විශේෂඥතාව ප්‍රයෝජනයට ගැනීමට අවකාශය සහ නිදහස ලබා දීම බෙහෙවින් ප්‍රබෝධවත් අත්දැකීමක් විය.

අපගේ ගමන් මග තුළ දී අප වෙත අගනා සහයෝගයක් ලබා දීම සිදු කළ ව්‍යාපාරික හවුල්කරුවන්, ආයෝජකයන් සහ නියාමකයන් නිරන්තරයෙන් ඇගයීමට ලක් වනු ඇත. HNB ඇෂුවරන්ස් සමූහයේ සභාපතිනිය ලෙස සේවා ඉටු කිරීමට සැලසීම සම්බන්ධයෙන් මා බෙහෙවින් සතුටට පත් වන අතර HNB ඇෂුවරන්ස් සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම් දැනටමත් නිර්මාණය වී ඇති ශක්තිමත් පදනම් මත පිහිටා සිටිමින් සාර්ථකත්වයේ අඛණ්ඩ ගමන් මග ඔස්සේ අනාගතයේ දී සිය අභිලාෂයන් සාක්ෂාත් කරගනු ඇති බවට මා වෙත කිසිදු සැකයක් නොමැත.

රෝස් කුරේ
සභාපතිනිය
කොළඹ, ශ්‍රී ලංකාව
2024 පෙබරවාරි 15

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

## හිතවත් පාර්ශවකරුවනි,

HNB ඇෂුවරන්ස් PLC විසින් ගෙවී ගිය වසර තුළ දී ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ යන අංශ දෙකෙහිම ශක්තිමත් කාර්ය සාධනයක් වාර්තා කළ අතර කර්මාන්තයේ බොහෝ සීමා අභිබවා යැමට සමත් විය. ජීවිත රක්ෂණ ක්ෂේත්‍රය ඉතා ඉහළ වර්ධනයක් අත් පත් කර ගත් අතර 2023 වසරේ දී කර්මාන්තයේ වර්ධනයන් අභිබවා යැමට සමත් විය. ආදායමෙහි 23% ක ආකර්ෂණීය වර්ධනයක් සමඟින් වර්ධනය දෙගුණ කරගැනීමට මෙම ක්ෂේත්‍රය සමත් වී ඇත. අභියෝගාත්මක පරිසරයක් මධ්‍යයේ වුවද 29% ක නව ව්‍යාපාර වර්ධනයක් සහ 17% ක ජීවිත රක්ෂණ අලුත් කිරීමේ වර්ධනයක් අත්පත් කරගත්තේය. සාමාන්‍ය රක්ෂණය ද 18%ක වර්ධනයක් වාර්තා කළ අතර මෝටර් රථ නොවන ක්ෂේත්‍ර කෙරෙහි ද යොමු වීම මෙහි දී විශේෂත්වයකි.

මේ අනුව මෝටර් රථ රක්ෂණය මත යැපීම අවම කරමින් සාර්ථක ලෙස ආදායම් විවිධාංගීකරණයකට සමාගමට යොමු වීමට හැකි විය. අපගේ කාර්ය මණ්ඩලය, නියෝජිතායතන ජාල, ව්‍යාපාරික හවුල්කරුවන් සහ මව් සමාගම ශක්තිමත් පරිපාලන පද්ධති වෙත අනුගත වී ශක්තිමත් පදනමක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කර ඇත.

### උපාය මාර්ගික ප්‍රවේශයන්හි ප්‍රගතිය

ජීවිත හා සාමාන්‍ය රක්ෂණය සඳහා වූ මධ්‍යකාලීන උපාය මාර්ග වෙන් වෙන් වශයෙන් ප්‍රමාණාත්මකව, සරලව හා පැහැදිලි ආකාරයෙන් සන්නිවේදනය කිරීම තුළින් වැඩසටහන් නියමිත කාලයන්හිදී ක්‍රියාත්මක කිරීම සහතික කෙරේ. අපගේ අනාගත අභිලාෂයන් 2022 වසරේ සිට නොවෙනස්ව පවතී.

2026 වසර වන විට වෙළඳපල කොටස 10% දක්වා ඉහළ නංවා ගනිමින්, දෙවන පෙළ සමාගම් අතර ප්‍රමුඛයා ලෙස දැනට පවතින තත්ත්වය ඉහළ නංවා ගනිමින් පළමු පෙළ සමාගමක් බවට වර්ධනය වීමට ජීවිත රක්ෂණ අංශය සැලසුම් කර ඇත. සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ඉලක්කය වන්නේ 2026 වසර වන විට පස් වසරක සැලැස්මක් යටතේ දැඩි තරගකාරීත්වයක් ඇති මෙම වෙළෙඳපොළ තුල 5 වන ස්ථානය දක්වා ගමන් කිරීමයි. වර්තමාන මෙහෙයුම් පරිසරය සමග ගැළපෙන ආකාරයට සවිස්තරාත්මක සැලසුම් සකස් කර ඇති අතර 2022 වසරේ දී මෙම උපාය මාර්ග අනුගමනය කිරීමෙන් අප ලත් අත්දැකීම් ද ඊට පාදක කර ගෙන තිබේ.

### ජීවිත රක්ෂණය

රක්ෂණ නියෝජිතයන් සහ හවුල්කාරීත්ව නාලිකා සඳහා ඉලක්ක ගත උපායමාර්ගයක් ලබා දෙමින් අලෙවි කණ්ඩායම් පුහුණු කිරීම සහ ප්‍රවර්ධනය තුළින් ජීවිත රක්ෂණ අංශය සංවර්ධනය කෙරිණ. දිවයින පුරා ශාඛා 69ක් දක්වා අපගේ ජාලය ව්‍යාප්ත කළ අතර උපදේශක බළකාය 4,000කට වඩා ශක්තිමත් කළෙමු. මෙම වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස නව ව්‍යාපාරයේ 37%ක වර්ධනයක් වාර්තා කළ අතර එය පෙර වසරවලට වඩා සැලකිය යුතු ඉහළ යෑමකි. වරලත් නියෝජිත ක්‍රමයක් ද අප විසින් හඳුන්වා දෙනු ලැබූ අතර මේ ඔස්සේ ඉතා හොඳ පිරිවැය කාර්යක්ෂමතාවක් අත් කර ගැනීමට හැකි විය. 2024 වසරේ දී මෙම සංකල්පය තවදුරටත් වර්ධනය කිරීමට නියමිතයි.

මෙම අංශය ඔස්සේ ලැබෙන දායකත්වය 21%කට වඩා වැඩි කරමින් හවුල්කාරිත්ව නාලිකා තවදුරටත් පුළුල් කිරීමට නියමිතය. HNBA සමූහ ව්‍යාපාරයේ ප්‍රධාන ආයතන සමඟ ඇති හවුල්කාරිත්වය ඉලක්කගත පුහුණුවක්, වෙනස් වූ වෘත්තීය මාවතක් සහ අන්‍යයන් දිරිමත් කිරීමට උපකාරී වන ජයග්‍රහණ හඳුනාගැනීම සමඟින් අඛණ්ඩව වර්ධනය කෙරෙනු ඇත. අප ආයතනයේ රක්ෂණ සේවාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා අනෙකුත් බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන හා සම්බන්ධ වීමෙන් අපගේ පාරිභෝගික පදනම තවදුරටත් පුළුල් කිරීමට සමූහයට හැකියාව ලබා දෙයි.

2024 වර්ෂයේදී මූලික පද්ධති ක්‍රියාත්මක කිරීම හරහා තාක්ෂණික පරිවර්තනයේ සැලකිය යුතු ප්‍රගතියක් ඇති කරගැනීමට හැකි විය. රොබෝ තාක්ෂණය ඔස්සේ ස්වයංක්‍රීයකරණය හඳුන්වා දීමට අප පියවර ගෙන ඇති අතර කෘතිම බුද්ධිය සහ ස්වාධීන බොට්වරුන්ගේ දායකත්වය 2026 වසර වන විට පුළුල් කිරීමට නියමිතයි. මෙම වර්ධනයන් ඔස්සේ අපගේ සාමාන්‍ය කාර්යයන් සිදු කෙරෙන ආකාර සපුරා වෙනස් වනු ඇත. කාර්ය මණ්ඩලය වඩාත් අභියෝගාත්මක භූමිකාවන් වෙත යොමු වනු ඇත. ඒ සමගම ඔවුන්ගේ රැකියා තෘප්තිය වර්ධනය කිරීමට ද අපේක්ෂිතයි. මෙම වැඩපිළිවෙළට සමගාමී ලෙසින් සිදුවන කළමණාකරණ වෙනස්කම් ඔස්සේ මෙම පරිවර්තනයට සහය ලැබෙන අතර බාධාවකින් තොරව නව තාක්ෂණය වෙත සංක්‍රමණය වීම සහතික කරයි. සියලුම කාර්ය මණ්ඩලයට නව ක්‍රම සම්බන්ධයෙන් පුහුණුව ලබා දෙනු ඇත. විකුණුම්, ප්‍රතිරක්ෂණ, හිමිකම් සහ සේවා පද්ධති ක්‍රමයෙන් කෘතිම බුද්ධිය පාදක වූ තාක්ෂණයන් වෙත ක්‍රමානුකූලව නැඹුරු කිරීමට නියමිත වන අතර ඒ ඔස්සේ කාර්යක්ෂමතාව වැඩි කරගැනීමට සැලසුම් කර තිබේ. මෙහි දී සැලකිය යුතු කරුණක් නම්, නවීන තාක්ෂණය වෙත සංක්‍රමණය වීමේ අපගේ කැපවීම සමඟ යොමු වෙමින් විකුණුම්වලින් 95% ක් විකුණුම් උපදේශකයන් විසින් ස්වයංක්‍රීය ලෙස සිදු කර ගැනීමට කටයුතු කිරීමයි.

සුවිශේෂී පාරිභෝගික සේවාවන් යනුවෙන් මෙහි දී හැඳින්වෙන්නේ අලෙවිකරණ බලකායේ ව්‍යාප්තිය

සහ තාක්ෂණික පරිවර්තනයට අදාළව ධනාත්මක අත්දැකීම් තුළින් පාරිභෝගිකයා ආකර්ෂණය කරගැනීමට යොමු වීමයි. කාර්යමණ්ඩලයේ මෘදු කුසලතා වර්ධනය කිරීම සහ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා සුදුසු ලෙස ඔවුන්ව දිරිමත් කිරීම මගින් අපි අපගේ උපාය මාර්ග තවදුරටත් ඉහළ නැංවීම සහතික කරන්නෙමු.

අපගේ සන්නාමකරණ උපාය මාර්ගය හා සමීපව බැඳී ඇති මෙය ශක්තිමත් හා යාවත්කාලීන වන්නක් වන අතර පාරිභෝගිකයන් රඳවා ගැනීමේ අනුපාත ඉහළ නැංවීමට සහාය වන්නකි. HNB සතුව MDRT ජයග්‍රාහකයින් 203 ක් ඇති අතර එය සමාගමේ ඉතිහාසයේ ඉහළම වාර්තා කිරීම පමණක් නොව, නියෝජිතයින්ගේ හැකියාව මෙන් ම මේ වන විට ක්‍රියාත්මක කර ඇති පුහුණු වැඩසටහන්වල ඵලදායීත්වය පෙන්නුම් කිරීමකි. මෙම අංශය ඔස්සේ ලැබූ වර්ධනයන් නිසා කර්මාන්තයේ ඉහළම සමාගම් තුන අතරට ඇතුළත් වීමේ හැකියාව ද ලැබිණ. Global Banking & Finance Review (UK) විසින් අඛණ්ඩව 3 වැනි වරටත් ප්‍රමුඛතම බැංකු රක්ෂණ නාලිකාව ලෙස පිළිගැනීමට හැකිවීම ද අප ලැබූ සුවිශිෂ්ට ජයග්‍රහණයකි.

## සාමාන්‍ය රක්ෂණ අංශය

සාමාන්‍ය රක්ෂණය ක්ෂේත්‍රය තුළ දී අපගේ අවධානය යොමු වී ඇත්තේ නිපුණතා ගොඩනැගීම, තාක්ෂණික පරිවර්තන, උසස් තත්ත්වයේ නිෂ්පාදන සහ සේවා සැපයීම මෙන් ම තිරසාර අනාගතයක් ගොඩනැගීම කෙරෙහිය. මෙම ව්‍යාපාරික ක්ෂේත්‍රය හුදෙක් සාම්ප්‍රදායික මෝටර් වාහන රක්ෂණයෙන් ඔබ්බට ගොස් විවිධාංගීකරණය කිරීම සඳහා නව උපායමාර්ගික වැඩපිළිවෙළක් සකස් කර ඇත. ආනයන සීමා කිරීම් හේතුවෙන් ඉතා සුළු වර්ධනයක් පෙන්නුම් කරමින් තිබූ වෙළඳපලක් තුළ ඉහළ පෙළේ සමාගම් සමඟ ඵලදායී ලෙස තරඟ කරමින් "3 in 1" මෝටර් රක්ෂණ යෝජනා ක්‍රමය වෙළඳපොලේ ආකර්ෂණය සාර්ථක ලෙස දිනා ගැනීමට සමත් විය. HNBGI විසින් ප්‍රථම වරට පරාමිතික (බෝග සහ පශු සම්පත්) රක්ෂණ යෝජනා ක්‍රමයක් වෙළෙඳපොළට හඳුන්වා දුන් අතර 2024 වසරේ දී මෙම ව්‍යාපාරය තවදුරටත් වර්ධනය කිරීමට බලාපොරොත්තුවේ. දේශසීමා ඉක්මවා යමින් සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන් ගෝලීය වශයෙන් තර්ජන උත්සන්න වීමත් සමඟ මෑත වසරවලදී හඳුන්වා දුන් සයිබර් රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ඇති වෙළෙඳපොළ අවකාශය සිත් ගන්නා සුළු එකකි.

මෙම උපාය මාර්ග මගින් HNBGI සමාගමට මෝටර් රථ රක්ෂණය මත යැපීමෙන් තොරව තම ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීමට හැකි විය. ඒ අනුව දළ ලේඛනගත වාරිකවලින් 18%ක් සඳහා අනෙකුත් ව්‍යාපාරික මාර්ග සාර්ථකව යොදා ගැනීමට හැකි වී තිබේ. මෙම අතිශය තරඟකාරී වෙළඳපල තුළ පාරිභෝගික අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා අප ගත් උපායමාර්ගික වැඩපිළිවෙළ තුළ ඇති සඵලතාවය වඩාත් සනාථ කරමින් ශුද්ධ ප්‍රවර්ධක දර්ශක සහ පාරිභෝගික තෘප්තිය පිළිබඳ දර්ශක තුළ අඛණ්ඩ වර්ධනයක් නිරීක්ෂණය කිරීමට ලැබීම ගැන බෙහෙවින් සතුටට පත් වෙමි. HNBGI යනු වඩාත් ආකර්ෂණයට ලක් වූ සාමාන්‍ය රක්ෂණ සන්නාමය ලෙස ශ්‍රේණිගත වීම පාරිභෝගිකයා කෙරෙහි අප තුළ ඇති සැලකිල්ලට සාක්ෂියකි.

## කාර්ය සාධනය

දළ ලේඛනගත වාරික ප්‍රමාණය රුපියල් බිලියන 18.7 දක්වා ඉහළ යාමත් සමඟ HNBA සමූහයේ ආදායම් වර්ධනය 20%ක් වූ අතර එය සමූහයේ ඉතිහාසයේ වාර්තා වූ ඉහළම අගයයි. අලෙවිකරණ බලකායේ ව්‍යාප්තිය, ඔවුන්ගේ ධාරිතා ඉහළ නැංවීම සහ පාරිභෝගිකයින්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා විසඳුම් මාලාවක් ලබා දීම ඔස්සේ මෙම සාර්ථකත්වය අත් කර ගැනීමට හැකි විය. සමූහය විසින් ප්‍රතිරක්ෂණ සඳහා සිය විචක්ෂණාත්මක ප්‍රවේශය අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිරක්ෂණකරුවන්ට ගෙවීමට සිදු වන වාරිකය 35% කින් හෙවත් රු. බිලියන 2.9 කින් ඉහළ ගියේය. ඒ අනුව, තිරසාර වර්ධනයක් පිළිබිඹු කරමින් ශුද්ධ ඉපැයූ වාරිකය රුපියල් බිලියන 15.7 දක්වා 20% කින් වැඩි විය. අඩුවන පොලී අනුපාත ඔස්සේ වසරක් තුළ හොඳ ආයෝජන උපාය මාර්ගයක් තුළින් ප්‍රශස්ත ඵලදායකත්වයක් ලැබීම නිසා අනෙකුත් ආදායම් රුපියල් බිලියන 7.6 දක්වා 46% කින් වැඩි විය. මෙමගින් ශුද්ධ ආදායම රු.බිලියන 23.3 දක්වා ඉහළ නැංවුණු අතර එහි වර්ධනය 27% කි. දීර්ඝ කාලීන වැඩපිළිවෙළක් යටතේ නිසි ප්‍රතිරක්ෂණ මූලධර්ම මගින් සකස් කරන ලද ඵලදායී වර්ධනය සහ ආයෝජන උපාය මාර්ග කෙරෙහි මෙහි දී යොමු වෙයි.

මුළු ප්‍රතිලාභ සහ හිමිකම් රුපියල් බිලියන 6.7 දක්වා 19% කින් වැඩි වූ අතර ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ පරිණත හිමිකම් සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මෝටර් වාහන රක්ෂණ හිමිකම් ඔස්සේ මෙම තත්ත්වය ඇති විය. එසේ ම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සිදු කරන ලද සැලකිය යුතු ආයෝජන සහ උද්ධමනයේ බලපෑම් හේතුවෙන් ද වියදම් 30% කින් වැඩි විය. බදු ගෙවීමට පෙර ලාභය 5% කින් රුපියල් බිලියන 2.5 දක්වා ඉහළ ගොස් ඇති අතර එය අවධානය යොමු කළ යුතු වර්ධනීය අවස්ථාවකි. එසේ ම ජීවිත රක්ෂණ අරමුදලට අඩු පොලී අනුපාතවල බලපෑමෙන් මධ්‍යස්ථ වූ වේගවත් ආයෝජන උපාය මාර්ගයක් ඇති වීම මෙයට බලපෑවේය. වැඩි වූ බදු අනුපාත හේතුවෙන් 2022 වසරේ දී 24% සිට 2023 දී 30% දක්වා ඵලදායි බදු අනුපාතිකය වැඩි වීම නිසා වසර තුළ බදුකරණය 34% කින් වැඩි විය. ඒ අනුව, බදු ගෙවීමෙන් පසු ලාභය රුපියල් බිලියන 1.8 දක්වා 4% කින් අඩු විය.

ස්ථාවර ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් වන Fitch Ratings

විසින් HNBA සහ HNBGI යන දෙකෙහිම ශ්‍රේණිගත කිරීම් A-(lka) ලෙසින් තහවුරු කරන ලදී. මෙම ශ්‍රේණිගත කිරීම මෙරට රක්ෂණ ක්ෂේත්‍රය සඳහා වන ඉහළම අගයන් අතර වීම විශේෂත්වයකි. සමූහය සඳහා වසර අවසානයේදී මුළු වත්කම්වලින් ස්වෛරී නිරාවරණය 49% ක් විය. ඉන්දියානු වාණිජ මණ්ඩලය විසින් පවත්වන ලද සිව්වැනි Emerging Asia Awards 2023 හිදී HNBA ශ්‍රී ලංකාවේ හොඳම ජීවිත රක්ෂණ සමාගම ලෙස පිළිගැනීමට ලක් වූ අතර MDRT සඳහා ලොව හොඳම සමාගම් 100 අතරට ලැයිස්තුගත විය. Global Banking & Financial Review (UK) විසින් Bancassurance නාලිකාව හොඳම බැංකු සහතික කිරීමේ නාලිකාව ලෙසද පිළිගනු ලැබිය.

### ජීවිත රක්ෂණ අංශය

ජීවිත රක්ෂණ අංශය දළ ලේඛනගත රක්ෂණ වාරිකයේ 23%ක ශක්තිමත් වර්ධනයක් ලබා ගැනීමට සමත් වූ අතර 29%ක නව ව්‍යාපාර වර්ධනයක් ද පෙන්නුම් කළේය. ආයෝජන ආදායමේ 59% ක වර්ධනයක් හරහා අනෙකුත් ආදායම වැඩිදියුණු විය. සමස්තයක් වශයෙන්, ජීවිත රක්ෂණ ව්‍යාපාරය පෙර වසරට වඩා 14% ක වර්ධනයක් සනිටුහන් කරමින් බදු ගෙවීමට පෙර ලාභය ලෙස රුපියල් බිලියන 2.3ක් වාර්තා කළේය. 2023 වසරේ වූ ඉහළ බදු අනුපාතය යටතේ වුවද බදු ගෙවීමෙන් පසු ලාභය රුපියල් බිලියන 1.6 ක් වූ අතර එය 9% ක වැඩි වීමකි. මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 43 දක්වා 28% කින් වැඩි වූ අතර 29% කින් රුපියල් බිලියන 38.5 ක් දක්වා මූල්‍ය ආයෝජන ඉහළ ගියේය. මූල්‍ය ආයෝජන මුළු වත්කම්වලින් 89%ක් වූ අතර ස්වෛරී නිරාවරණය මුළු වත්කම්වලින් 52%ක් විය. ශක්තිමත් ව්‍යාපාර වර්ධනයක් හේතුවෙන් රක්ෂණ ගිවිසුම් වගකීම් රුපියල් බිලියන 30.9 දක්වා 26% කින් වැඩි විය.

### සාමාන්‍ය රක්ෂණය

දළ ලේඛනගත රක්ෂණ වාරික ආදායමේ වර්ධනය 18% කින් හෙවත් රුපියල් බිලියන 8 දක්වා වර්ධනය කරගැනීමේ දී සාමාන්‍ය රක්ෂණ අංශය විවිධාංගීකරණය කිරීමේ වර්ධන උපාය මාර්ගය අනුගමනය කෙරිණ. විදේශ මුදල් ආයෝජනවල දී විදේශ විනිමය පරිවර්තන පාඩු හේතුවෙන් අනෙකුත් ආදායම් රුපියල් බිලියන 1.1 ක් දක්වා අඩු විය. වඩාත් සැලකිලිමත්භාවයෙන් සිදු කෙරුණු ප්‍රතිරක්ෂණයන් සහ හිමිකම් කළමනාකරණයන් නිසා ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් වැඩිවීම රුපියල් බිලියන 3.9 දක්වා සීමා විය. අනෙකුත් මෙහෙයුම් වියදම් ද 18% ක මට්ටමේ කළමනාකරණය කරන ලදී. කෙසේ වෙතත්, සමස්ත බලපෑම නිසා ලාභය රුපියල් මිලියන 242 දක්වා 51% කින් අඩු විය. බදුකරණය 101% කින් වැඩි වූ අතර එමගින් HNBGI සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය 66% කින් හෙවත් රු. මිලියන 151 කින් අඩු විය. ආයෝජන රුපියල් බිලියන 5.3 දක්වා 11% කින් වැඩි වීමත් සමග මුළු වත්කම් රුපියල් බිලියන 9.5 දක්වා 12% කින් වැඩි විය. HNBGI සඳහා මුළු වත්කම් ස්වෛරී නිරාවරණය 29% ක් විය.

### කණ්ඩායම් ගොඩනැගීම

ව්‍යාපාරයක තිරසාර වර්ධනය සඳහා විශ්වාසය ගොඩනැගීම ඉතා වැදගත් වන අතර හැකියාව සහ කුසලතා ඇති පුද්ගලයින් සංවර්ධනය කිරීම සහ රඳවා ගැනීම උපායමාර්ගික ප්‍රමුඛතාවයක්වේ. රඳවා තබා ගැනීමේ අනුපාත පවත්වා ගෙන යෑම මෙම වසර තුළ දී දැඩි අභියෝගාත්මක තත්ත්වයකට පත් වූ අතර වෘත්තිකයන් මෙන් ම පුහුණු සහ නුපුහුණු සේවකයන් ආර්ථික කාරණා මත පදනම්ව සංක්‍රමණය වීම මෙහි දී ප්‍රධානතම ගැටලුවක් විය. නව උසස්වීම් ගණනාවක් මෙම කාලය තුළ දී ලබා දීම සිදු වූ අතර ඉලක්කගත පුහුණුවක් සමග ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැපයීමට ක්‍රියාමාර්ග ගැණින.

සේවිකාවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම මෙන් ම දක්ෂතා හිඟය මඟහරවා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමේ වැදගත්කම අප හඳුනාගත් අතර කාන්තා දක්ෂතා සවිබල ගැන්වීමට අඛණ්ඩව අවධානය යොමු විය. CIMA සහ Satyn සඟරාව ශ්‍රී ලංකාවේ හොඳම කාන්තා හිතකාමී සේවා ස්ථාන 10 න් එකක් ලෙස දෙවන වරටත් අපගේ උත්සාහය නැවත පිළිගැනීමට ලක් කළේය. ප්‍රථම වරට විශිෂ්ටතම කාන්තාවන් සඳහා වන සම්මානයක් අප විසින් හඳුන්වා දෙනු ලැබූයේ කාන්තාවන්ට ඔවුන්ගේ වෘත්තීය ජීවිතය තුළ ඉහළ ප්‍රගතියක් ලබා ගැනීමට පෙළඹවීමේ අරමුණෙනුයි. කාන්තාවන් දිරිගැන්වීම සඳහා තානාපතිවරියන් තෝරා ගැනීම සිදු වූ අතර In.she වැඩසටහන මේ සඳහා දායක විය. In.she වැඩසටහන රටේ හොඳම කාන්තා සවිබල ගැන්වීමේ වැඩසටහනක් ලෙස CIMA සහ Satyn සඟරාව විසින් පිළිගනු ලැබිය.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය පුහුණු කිරීම සඳහා ලංකා සේවා යෝජකයින්ගේ සම්මේලනය හරහා පවත්වන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ වැඩසටහනට සහභාගී වූ සමාගම් හතරෙන් එකක් බවට HNBA පත්විය. කාර්ය සාධනය සහ වෘත්තීය ප්‍රගතියට සහාය වීම සඳහා වසර පුරා පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කිරීමට සමාගම කටයුතු කළේය. ක්‍රීඩාවේ සිට සංගීතය දක්වා අපගේ කාර්ය මණ්ඩලය සඳහා අවස්ථාවන් සම්පාදනය කර දෙනු ලැබූ අතර, වාර්ෂික ආයතනික සමුළුවේ අවසන් තරගයක් දක්වා සහභාගී වීමට මාස 5 ක කාලයක් ඔවුනට අවශ්‍ය අවකාශය සැපයිණ. කණ්ඩායම් චිත්ත ධෛර්යය ගොඩනැගීම මෙන් ම ධනාත්මක සහ විවෘත ආයතනික සංස්කෘතියක් පෝෂණය කිරීමට මෙම සියලුම වැඩසටහන් පාදක වී ඇත.

### අවදානම් කළමනාකරණය

අවධානය යොමු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර වශයෙන් විශේෂයෙන් වෙළඳපල අවදානම් සාධක ස්ථාවර

කිරීම සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති නමුත් මෙහෙයුම් පරිසරය අඛණ්ඩව අභියෝගාත්මක වන බැවින් අවදානම කළමනාකරණය කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කර ඇත. උද්ධමනය, පොලී අනුපාත සහ විනිමය අනුපාත සියල්ල වසර තුළ ස්ථාවර විය. දේශීය ණය ප්‍රශස්තකරණයේ විසඳුම ආයෝජන කළඹ සඳහා බලනොපාන බැවින් සහනයක් විය. විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම තවම අවසන් කර නොමැති බැවින්, HNBA සමූහයට විදේශ මුදල් වලින් සිදු කෙරෙන රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් කිසිදු නිරාවරණයක් නොමැත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 මූල්‍ය ස්ථායීතා සමාලෝචනයේදී හඳුනාගෙන ඇති පරිදි මූල්‍ය අංශයේ ස්වෛරීත්වය නිරාවරණය වීම අවධානයට ලක් කර ඇත. වර්ෂය තුළ දක්ෂතා සහිත පුද්ගලයන් සංක්‍රමණය වීම අඛණ්ඩව සිදු වූ බැවින් පුද්ගලයින් සම්බන්ධ අවදානම් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා ඇත. උපයෝජ්‍ය ආදායම් අඩුවීම ද අභියෝගයක් වන්නේ ඒ ඔස්සේ රක්ෂණ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අඩු කළ හැකි බැවිනි.

HNBA සමූහය විසින් HNBA සඳහා 339% සහ HNBGI සඳහා 208% ක ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාත සමග ධරණීය ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ආරක්ෂිත කලාප පවත්වාගෙන යයි

## ESG වාර්තාකරණය සඳහා කැපවීම

ESG වාර්තාකරණයේ විශිෂ්ටත්වය සඳහා අපගේ කැපවීම ජාත්‍යන්තර මට්ටමින් ARC සම්මාන උළෙලේදී ඇගයීමට ලක් වූ අතර එහිදී 2022 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව අනුව ශ්‍රී ලංකාවේ හොඳම වාර්තාව මෙන් ම රක්ෂණ අංශයේ හොඳම ලේඛනය ලෙස ඇගයීමට ලක් විය. කලාපීය මට්ටමින්, මෙම වාර්තාවට දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ රක්ෂණ අංශයේ හොඳම පරිචය වාර්ෂික වාර්තා සම්මාන සඳහා වන රිදී සම්මානය හිමි වූ අතර දේශීය වශයෙන් CA Sri Lanka TAGS සම්මාන උළෙලේදී රක්ෂණ අංශයේ රිදී සම්මානයකින් පිළිගැනීමට ලක්විය.

## අන්තර්ග්‍රාහී නිෂ්පාදන

HNBA සමූහය විසින් පුද්ගලයන්ගේ ජීවිත 500,000කට අධික ප්‍රමාණයක් ආවරණය කර ඇති අතර විවිධ අවදානම් සඳහා රක්ෂණය සපයයි. 2022 දී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායක අංශය සමඟ සැලකිය යුතු ආකර්ෂණයක් ලබා ගත් ක්ෂුද්‍ර රක්ෂණ නිෂ්පාදනයක් සංවර්ධනය කිරීමත් සමඟ අපගේ සාකල්‍ය ප්‍රවේශය ගැඹුරු විය.

2023 වසරේ දී අප විසින් පළමු වරට බෝග සහ පශු සම්පත් සම්බන්ධයෙන් රක්ෂණ විසඳුමක් වෙළඳපොල තුළ දියත් කළ අතර කාර්ය සාධනය තක්සේරු කිරීමට සහ නව ඉලක්ක වෙළඳපල කොටසක ගැටළු අවබෝධ කර ගැනීමට වෙළඳපල ප්‍රතිචාරය සමීපව නිරීක්ෂණය කරන්නෙමු.

ක්ෂුද්‍ර බණ්ඩය යටතේ අපගේ පැවැත්ම වර්ධනය කිරීම සඳහා ගොවිජන දෙපාර්තමේන්තුව හරහා නව අලෙවි නාලිකාවක් ආරම්භ කළෙමු. HNBA නිලධාරීන් දිස්ත්‍රික්ක 5 ක දී ගොවිජන දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කරන අතර ඉන් පසුව එය දිවයින පුරා මෙම වැඩපිළිවෙළ ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ.

HNBA අපගේ නිෂ්පාදන ව්‍යුහගත කිරීම සඳහා අන්තර්ග්‍රාහී මූලධර්ම භාවිතා කරන ආකාරය පිළිබඳ තවත් උදාහරණයක් වන්නේ පවුල් පාදක සංකල්පයේ ව්‍යාප්තියයි. SupremeHealth Max Unlimited යෝජනා ක්‍රමය මේ වන විට වෙළඳපොලේ ජනප්‍රියත්වයට පත් ව ඇති අතර එය කලත්‍රයා, දරුවන්, දෙමාපියන් සහ මාමණ්ඩිය හෝ නැන්දනිය එක් රක්ෂණාවරණයකට ඇතුළත් කිරීමට හැකි වන පරිදි HNBA විසින් E-Life (Online Term Insurance Plan) යටතේ හඳුන්වා දෙන ලදී. මෙය මසකට රුපියල් 300 ක මුදලකට අන්තර්ජාලය හරහා මිලදී ගත හැකි රුපියල් මිලියනයක ප්‍රතිලාභ ලැබෙන ආවරණයකි. මෙම යෝජනා ක්‍රමය තනි පුද්ගලයෙකු විසින් ආදායම් ඉපැයීමේ පවුල් සඳහා ඉතා හොඳින් ගැළපේ.

## සබැඳි ප්‍රජාවන්

මෙම වාර්තාවේ දක්වා ඇති රුක් රෝපණ ව්‍යාපාර සහ පාසල් ජල ව්‍යාපෘති සමඟින් ප්‍රජාව වෙත සේවා ඉටු කිරීමේ අපගේ පරිත්‍යාගශීලී වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. වඩාත් ශක්තිමත් හා සියලු දෙනා අන්තර්ග්‍රහණය කිරීමේ ව්‍යාපාරයක් ගොඩනැගීමේ HNBA ඉලක්කයට නව ප්‍රමිතීන්ට අනුගත වන අතරම එහි ESG ගමනේ ප්‍රගතිය සඳහා හොඳින් සනිටුහන් වෙයි.

## ඉදිරි මාර්ගය

රටේ ආර්ථිකය 2023 වසරට වඩා හොඳ තත්ත්වයකින් 2024 වසරේ දී වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු. කෙසේ වෙතත්, පවතින ආර්ථික තත්ත්වය තවමත් දුර්වල බැවින් සහ 2024 ප්‍රධාන මැතිවරණ වසරක් බැවින් අවදානම් සහගත තත්ත්වයන් පවතී. සංචාරක ආදායම් සහ ප්‍රේෂණවල ප්‍රබල වර්ධනයක් 2024 වසරේ දී අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතර මාස 2.6ක කාලයක් සඳහා ආනයන සිදු කිරීමට අවශ්‍ය විදේශ විනිමය සංචිත දැනට පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම පිළිබඳ ක්‍රියාවලියේ රැඳී සිටීම සහ වර්ධනය ස්ථාවර කිරීම සඳහා බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කිරීම ඉතා වැදගත් වේ. 2024 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව 3% ක වර්ධනයක් පුරෝකථනය කර ඇති අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වඩා ගතානුගතික අදහසක් දරමින් 1.8% ක වර්ධනයක් අපේක්ෂා කරයි.

රක්ෂණයේ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්භාවය වැඩිවීම ධනාත්මක වර්ධනයක් වන අතර එය ශ්‍රී ලංකාව තුළ අතිශයින් අඩු මට්ටමක පැවති විනිවිදභාවය වර්ධනය කිරීමට සහාය වේ. වඩාත්ම අවදානමට ලක්විය හැකි පුද්ගලයින් සඳහා ආරක්ෂිත

ආවරණයන් සැපයීම සඳහා HNBA විසින් අනුගමනය කරන ලද වඩාත් අන්තර්ග්‍රාහී ප්‍රවේශය ධනාත්මක ප්‍රතිඵල ලබා ඇත. නියෝජිතායතන සහ හවුල්කාරිත්ව නාලිකාවල වර්ධනය ඔස්සේ සැලසුම්ගත වර්ධන ගමන් පථයක් තුළ ඉදිරියට ගෙන යාමට සමූහයට ඉඩ ලැබී ඇති අතර සිය අන්තර්ග්‍රාහී ප්‍රවේශය සමග පාරිභෝගික පරාසය පුළුල් කර ගැනීමට හැකි වී තිබේ.

HNBA සමූහය වඩා යෝග්‍ය දිගු කාලීන ව්‍යාපාර ක්‍රියාවලියක් සහ විශිෂ්ට අවදානම් කළමනාකරණයක් කෙරෙහි අවධානය යොමු කර ඇත. ලේඛනගත දළ රක්ෂණ වාරික ආදායම වර්ධනය කිරීම, පුළුල් කිරීම සහ නිෂ්පාදන උපාය මාර්ග භාවිතා කිරීම මගින් වෙළඳපල කොටස වැඩි දියුණු කිරීමට අදාළ වන ගමන් මග මෙහෙයවන්නෙමු.

ඇගයීම්

දුෂ්කර වෙළඳපල තත්වයන් යටතේ ශක්තිමත් කාර්ය සාධනයක් ලබා දුන් ශක්තිමත් හා අධිෂ්ඨානශීලී කණ්ඩායමක් මෙහෙයවීමට ලැබීම මගේ වරප්‍රසාදයක් වන අතර මෙම කණ්ඩායම ලබා දුන් දායකත්වය වෙනුවෙන් ඔවුන් සෑම කෙනෙකුටම ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. තවත් අභියෝගාත්මක වසරක් පසු කිරීමේ දී සිතුමිණ ජයසුන්දර මහතා HNBGI වෙත ලබා දුන් නායකත්වය මෙහි දී අගය කර සිටිමි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් නැණවත් උපදෙස් හා මග පෙන්වීම සම්බන්ධව මා ස්තුතිවන්ත වන අතර ගෙවී ගිය වසර තුළ අපගෙන් සමුගත් රවී අබේසූරිය මහතා විසින් කරන ලද අමිල සේවය ද මෙහි දී සිහිපත් කර සිටිමි. 2024 වසරේ දී විශ්‍රාම ගැනීමට සූදානමින් සිටින HNBA සමූහ ව්‍යාපාරයේ වර්ධනය සඳහා සිය පාලන කාලය තුළ දී පරිවර්තනීය මෙහෙයක් ඉටු කළ සභාපතිනියගේ දායකත්වය ද බෙහෙවින් අගය කර සිටිමි.

නියාමක ආයතනය වශයෙන් පසුගිය වසර තුළ දී ලබා දුන් සහයෝගිතාව සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට (IRCSL) ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නෙමි. අපගේ වර්ධන ගමනේ කොටසක් වූ රක්ෂණ උපදේශකයින්, තැරැව්කරුවන්, බැංකු රක්ෂණ නිලධාරීන්, හවුල්කරුවන් සහ ප්‍රතිරක්ෂණකරුවන් ඇතුළු අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ට ද ස්තුතිය පළ කිරීම සඳහා මෙය අවස්ථා කර ගැනීමට කැමැත්තෙමි. තවද, 2023 වසරේ දී විශිෂ්ට කාර්ය සාධනයක් පෙන්නුම් කිරීම සඳහා අපගේ ප්‍රධාන සමාගම ලබාදුන් නොමඳ සහය වෙනුවෙන් HNB කළමනාකාරිත්වයට ස්තුතිය හිමි වනු ඇත. වර්ධනයේ මීළඟ අදියරයන් කරා පය ඔසවන මේ මොහොතේ දී ඉදිරි වසර තුළ ද ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය අපි බලාපොරොත්තු වන්නෙමු.

ලසිත විමලරත්න
ප්‍රධාන විධායක නිලධාරි
HNB ඇෂුවරන්ස් PLC
කොළඹ, ශ්‍රී ලංකාව
2024 පෙබරවාරි 15

# මූල්‍ය තත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට, | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2023 | 2022 | 2023 | 2022 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 689,549 | 418,258 | 480,796 | 260,442 |
| කල්බදු වත්කම් භාවිත කිරීමේ අයිතිය | 428,871 | 376,579 | 368,716 | 343,824 |
| අස්පෘශ්‍ය වත්කම් | 63,924 | 61,118 | 57,566 | 57,054 |
| විලම්භිත බදු වත්කම් | 1,528 | 99,430 | - | - |
| මූල්‍ය ආයෝජන | 43,855,383 | 34,624,131 | 38,530,656 | 29,844,875 |
| ආයෝජන පරිපාලිත සමගම | - | - | 1,150,000 | 1,150,000 |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය | 441,923 | 420,914 | 441,923 | 420,914 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ | 1,329,157 | 1,044,318 | 325,283 | 184,249 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | 1,858,407 | 1,853,670 | 45,940 | 18,547 |
| වෙනත් වත්කම් | 1,262,852 | 999,838 | 983,945 | 713,293 |
| රක්ෂණ ගිවිසුම් - විලම්භිත වියදම් | 208,471 | 163,995 | - | - |
| මුදල් සහ මුදල් සමානතා | 1,123,004 | 1,033,305 | 666,222 | 725,420 |
| **මුළු වත්කම්** | 51,263,069 | 41,095,556 | 43,051,047 | 33,718,618 |
| | | | | |
| **හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | | | | |
| **ප්‍රාග්ධනය හිමියන්ට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධනය** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,171,875 | 1,171,875 | 1,171,875 | 1,171,875 |
| රඳවා ගත් ලාභ | 9,039,864 | 7,822,715 | 7,618,252 | 6,552,433 |
| විකිණීම සඳහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත | 174,358 | (322,296) | 106,834 | (138,616) |
| වෙනත් සංචිත | (21,290) | 22,358 | (21,175) | 3,972 |
| ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්ගේ විකිණීමට සඳහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත අරමුදල් | (469,286) | (1,277,414) | (469,286) | (1,277,414) |
| සීමිත නියාමන සංචිතය | 381,156 | 381,156 | 381,156 | 381,156 |
| **ප්‍රාග්ධනය හිමියන්ට ආරෝපණය කළ හැකි ප්‍රාග්ධනය** | 10,276,677 | 7,798,394 | 8,787,656 | 6,693,406 |
| පාලනයට නතු නොවන අයිතිය | - | - | - | - |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 10,276,677 | 7,798,394 | 8,787,656 | 6,693,406 |
| | | | | |
| **වගකීම්** | | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත රක්ෂණ | 30,945,715 | 24,582,641 | 30,945,715 | 24,582,641 |
| රක්ෂණ ගිවිසුම් වගකීම් - සාමාන්‍ය රක්ෂණ | 4,694,303 | 4,181,588 | - | - |
| සේවක ප්‍රතිලාභ සඳහා වගකීම් | 333,860 | 236,424 | 192,127 | 142,692 |
| වත්මන් බදු වගකීම් | 530,009 | 253,810 | 453,230 | 209,338 |
| ප්‍රතිරක්ෂණ ණයහිමියන් | 696,915 | 959,693 | 302,211 | 227,512 |
| කල්බදු ණය හිමියන් | 450,304 | 410,719 | 395,383 | 376,926 |
| වෙනත් වගකීම් | 2,864,015 | 2,406,748 | 1,814,178 | 1,384,408 |
| බැංකු අයිරා | 471,271 | 265,539 | 160,547 | 101,695 |
| **මුළු වගකීම්** | 40,986,392 | 33,297,162 | 34,263,391 | 27,025,212 |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | 51,263,069 | 41,095,556 | 43,051,047 | 33,718,618 |

ඉහත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 210 හි ඇති මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාශය

| | සමූහය | | සමාගම | | | |
|---|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සදහා,** | 2023 | 2022 | 2023 | 2022 | සමූහය | සමාගම |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | % | % |
| දළ ලේඛණගත රක්ෂණ වාරික | 18,760,347 | 15,637,736 | 10,923,294 | 8,911,460 | 20 | 23 |
| ප්‍රති රක්ෂකයන්ට කැපකළ වාරික | (2,922,404) | (2,164,702) | (592,191) | (473,012) | 35 | 25 |
| **ශුද්ධ ලේඛණගත රක්ෂණ වාරික** | 15,837,943 | 13,473,034 | 10,331,103 | 8,438,448 | 18 | 22 |
| නොඉපයූ රක්ෂණ වාරික වල සංචිතයේ ශුද්ධ වෙනස | (138,553) | (385,557) | - | - | (64) | - |
| **ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික** | 15,699,390 | 13,087,477 | 10,331,103 | 8,438,448 | 20 | 22 |
| | | | | | | |
| **වෙනත් ආදායම්** | | | | | | |
| පොලී සහ ලාභාංශ ආදායම | 7,227,168 | 4,541,682 | 6,306,764 | 3,972,636 | 59 | 59 |
| උපලබ්ධි වූ ශුද්ධ (අලාභ)/ලාභ | (57,224) | 390,099 | 10,415 | 105,376 | (115) | (90) |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභ/(අලාභ) | 65,944 | (66,383) | 57,107 | (68,663) | 199 | 183 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 317,623 | 272,223 | 102,709 | 54,394 | 17 | 89 |
| වෙනත් ආදායම් | 12,046 | 36,442 | 9,447 | 33,223 | (67) | (72) |
| **මුළු වෙනත් ආදායම්** | 7,565,557 | 5,174,063 | 6,486,442 | 4,096,966 | 46 | 58 |
| **ශුද්ධ ආදායම** | 23,264,947 | 18,261,540 | 16,817,545 | 12,535,414 | 27 | 34 |
| | | | | | | |
| **ශුද්ධ ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | | | | | | |
| ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ ගෙවූ වන්දි | (6,426,719) | (5,551,509) | (2,654,147) | (2,224,412) | 16 | 19 |
| ශුද්ධ ගෙවිය යුතු රක්ෂණ වන්දි වල වෙනස | (239,365) | (27,488) | (22,289) | 54,885 | 771 | (141) |
| ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම් වෙනස | (6,332,739) | (4,340,103) | (6,332,739) | (4,340,103) | 46 | 46 |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (5,370,694) | (4,000,490) | (3,585,313) | (2,483,649) | 34 | 44 |
| ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කර ගැනීමේ වියදම් | (2,200,123) | (1,821,540) | (1,806,519) | (1,437,045) | 21 | 26 |
| මූල්‍ය සහ වෙනත් රක්ෂණ ආශ්‍රිත වියදම් | (183,812) | (134,488) | (147,496) | (111,424) | 37 | 32 |
| **මුළු ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | (20,753,452) | (15,875,618) | (14,548,503) | (10,541,748) | 31 | 38 |
| **බදු පෙර ලාභය** | 2,511,495 | 2,385,922 | 2,269,042 | 1,993,666 | 5 | 14 |
| ආදායම් බදු වියදම් | (746,846) | (555,398) | (655,723) | (510,046) | 34 | 29 |
| **වර්ෂය සදහා වූ ලාභය** | 1,764,649 | 1,830,524 | 1,613,319 | 1,483,620 | (4) | 9 |
| | | | | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම්, (බදු පසු)** | | | | | | |
| **ලාභාලාභ සදහා නැවත වර්ගීකරණය කරන ලද හෝ වර්ගීකරණය විය හැකි අයිතම** | | | | | | |
| -විකිණීම සදහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | 1,401,847 | (1,647,992) | 1,035,773 | (1,386,078) | 185 | 175 |
| - ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද උපලබ්ධි වූ ලාභාලාභ | (38,955) | - | (31,744) | - | (100) | (100) |
| -නැවත වර්ගීකරණය මත ක්‍රමක්ෂය කරන ලද අලෙවි සංචිතය | 49,549 | 32,893 | 49,549 | 32,893 | 51 | 51 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ අදායම් සංචිතයට පවරන ලද විකිණීම සදහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | (808,128) | 1,210,123 | (808,128) | 1,210,123 | (167) | (167) |
| - ලාභාලාභ සදහා නැවත වර්ගීකරණය කරන ලද හෝ වර්ගීකරණය විය හැකි අයිතම මත ආශ්‍රිත බදු | (107,659) | 78,671 | - | - | (237) | - |
| ලාභාලාභ සදහා නැවත වර්ගීකරණය නොකරන අයිතම | | | | | | |
| - ප්‍රති මිනුම් මත (අලාභ)/ලාභ - සේවක ප්‍රතිලාභ සදහා වෙන් කිරීම් | (63,303) | 37,945 | (25,147) | 10,586 | (267) | (338) |
| - ලාභාලාභ සදහා නැවත වර්ගීකරණය නොකරන අයිතම මත ආශ්‍රිත බදු | 19,655 | (4,166) | - | - | 572 | - |
| **වර්ෂය සදහා මුළු අනෙකුත් විස්තීර්ණ ආදායම , (බදු පසු)** | 453,006 | (292,526) | 220,303 | (132,476) | 255 | 266 |
| **වර්ෂය සදහා මුළු විස්තීර්ණ ආදායම** | 2,217,655 | 1,537,998 | 1,833,622 | 1,351,144 | 44 | 36 |
| | | | | | | |
| **ආරෝපණය කළ හැකි ලාභය :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට අදාළ වර්ෂයේ මුළු ලාභය | 1,764,649 | 1,830,524 | 1,613,319 | 1,483,620 | (4) | 9 |
| පාලනයට නතු නොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂය සදහා වූ ලාභය** | 1,764,649 | 1,830,524 | 1,613,319 | 1,483,620 | (4) | 9 |
| | | | | | | |
| **ආරෝපණය කළ හැකි මුළු විස්තීර්ණ ආදායම :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට අදාළ වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම | 2,217,655 | 1,537,998 | 1,833,622 | 1,351,144 | 44 | 36 |
| පාලනයට නතු නොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂය සදහා මුළු විස්තීර්ණ ආදායම** | 2,217,655 | 1,537,998 | 1,833,622 | 1,351,144 | 44 | 36 |
| | | | | | | |
| කොටසකට මූලික සහ තනුක ඉපැයීම් (රු.) | 11.76 | 12.20 | 10.76 | 9.89 | (4) | 9 |
| කොටසක් සදහා ලාභාංශ (රු.) | 3.90 | 3.65 | - | - | | |

ඉහත ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 211හි විගණනය කරන ලද ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

## හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය - සමූහය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | විකිණීම සදහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්ගේ විකිණීමට සදහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත අරමුදල් | සීමිත නියාමන සංචිතය | මුළු හිමිකරු ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 6,644,680 | 4,009 | (11,421) | (67,291) | 381,156 | 8,123,008 |
| අධිභාර බද්ද | | (172,489) | - | - | - | - | (172,489) |
| **වර්ෂයේ විස්තීර්ණ ආදායම** | | | | | | | |
| වර්ෂය සඳහා වූ ලාභය | - | 1,830,524 | - | - | - | - | 1,830,524 |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්, (බදු පසු)** | | | | | | | |
| -විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (1,536,428) | - | - | - | (1,536,428) |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ අදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 1,210,123 | - | - | - | 1,210,123 |
| - ප්‍රති මිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සැලසුම් | - | - | - | 33,779 | - | - | 33,779 |
| **වසර සඳහා අනෙකුත් මුළු විස්තීරණ ආදායම** | - | - | (326,305) | 33,779 | - | - | (292,526) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | 1,830,524 | (326,305) | 33,779 | - | - | 1,537,998 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ අදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (1,210,123) | - | (1,210,123) |
| **හිමිකරුවන් සමග සිදු වූ ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| අවසාන ලාභාංශය 2021 | - | (480,000) | - | - | - | - | (480,000) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 7,822,715 | (322,296) | 22,358 | (1,277,414) | 381,156 | 7,798,394 |
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 7,822,715 | (322,296) | 22,358 | (1,277,414) | 381,156 | 7,798,394 |
| **වර්ෂයේ විස්තීර්ණ ආදායම** | | | | | | | |
| වර්ෂය සඳහා වූ ලාභය | - | 1,764,649 | - | - | - | - | 1,764,649 |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්, (බදු පසු)** | | | | | | | |
| -විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 1,304,782 | - | - | - | 1,304,782 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ අදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (808,128) | - | - | - | (808,128) |
| - ප්‍රති මිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සැලසුම් | - | - | - | (43,648) | - | - | (43,648) |
| **වසර සඳහා අනෙකුත් මුළු විස්තීරණ ආදායම** | - | - | 496,654 | (43,648) | - | - | 453,006 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | 1,764,649 | 496,654 | (43,648) | - | - | 2,217,655 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ අදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 808,128 | - | 808,128 |
| **හිමිකරුවන් සමග සිදු වූ ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| අවසාන ලාභාංශය 2022 | - | (547,500) | - | - | - | - | (547,500) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 9,039,864 | 174,358 | (21,290) | (469,286) | 381,156 | 10,276,677 |

ප්‍රකාශිත ප්‍රාග්ධනය 2023 දෙසැම්බර් 31 වැනි දිනට සාමාන්‍ය කොටස් මිලියන 150ක් නියෝජනය කරයි. (2022 - සාමාන්‍ය කොටස් මිලියන 150)

ඉහත හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය - සමූහය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 212හි විගණනය කරන ලද හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය  - සමාගම

| | ප්‍රකාශිත පාග්ධනය | රඳවාගත් ඉපැයීම් | විකිණීම සඳහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්ගේ විකිණීමට සඳහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත අරමුදල් | සීමිත නියාමන | මුළු හිමිකරු ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 5,548,813 | 4,446 | (6,614) | (67,291) | 381,156 | 7,032,385 |
| **වර්ෂයේ විස්තීර්ණ ආදායම** | | | | | | | |
| වර්ෂය සඳහා වූ ලාභය | - | 1,483,620 | - | - | - | - | 1,483,620 |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් , (බදු පසු)** | | | | | | | |
| -විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (1,353,185) | - | - | - | (1,353,185) |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ අදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 1,210,123 | - | - | - | 1,210,123 |
| - ප්‍රති මිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සැලසුම් | - | - | - | 10,586 | - | - | 10,586 |
| **වසර සඳහා  අනෙකුත් මුළු විස්තීරණ ආදායම** | - | - | (143,062) | 10,586 | - | - | (132,476) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | 1,483,620 | (143,062) | 10,586 | - | - | 1,351,144 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ අදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (1,210,123) | - | (1,210,123) |
| **හිමිකරුවන් සමග සිදු වූ ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| අවසාන ලාභාංශය 2021 | - | (480,000) | - | - | - | - | (480,000) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 6,552,433 | (138,616) | 3,972 | (1,277,414) | 381,156 | 6,693,406 |
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 6,552,433 | (138,616) | 3,972 | (1,277,414) | 381,156 | 6,693,406 |
| **වර්ෂයේ විස්තීර්ණ ආදායම** | | | | | | | |
| වර්ෂය සඳහා වූ ලාභය | - | 1,613,319 | - | - | - | - | 1,613,319 |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් , (බදු පසු)** | | | | | | | |
| -විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 1,053,578 | - | - | - | 1,053,578 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ අදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (808,128) | - | - | - | (808,128) |
| - ප්‍රති මිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සැලසුම් | - | - | - | (25,147) | - | - | (25,147) |
| **වසර සඳහා  අනෙකුත් මුළු විස්තීරණ ආදායම** | - | - | 245,450 | (25,147) | - | - | 220,303 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | 1,613,319 | 245,450 | (25,147) | - | - | 1,833,622 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ අදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 808,128 | - | 808,128 |
| **හිමිකරුවන් සමග සිදු වූ ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | | |
| අවසාන ලාභාංශය 2022 | - | (547,500) | - | - | - | - | (547,500) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 7,618,252 | 106,834 | (21,175) | (469,286) | 381,156 | 8,787,656 |

ප්‍රකාශිත ප්‍රාග්ධනය 2023 දෙසැම්බර් 31 වැනි දිනට සාමාන්‍ය කොටස් මිලියන 150ක් නියෝජනය කරයි. (2022 - සාමාන්‍ය කොටස් මිලියන 150)

ඉහත හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය  - සමගම, වාර්ෂික වාර්තාවේ පිටු අංක 213හි විගණනය කරන ලද හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා,** | | **2023** | **2022** | **2023** | **2022** |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| බදු පෙර ලාභය | | 2,511,495 | 2,385,922 | 2,269,042 | 1,993,666 |
| **ගැළපීම්:** | | | | | |
| පොලී ආදායම | | (7,217,300) | (4,533,060) | (6,297,089) | (3,860,664) |
| ලාභාංශ ආදායම | | (9,868) | (8,622) | (9,675) | (111,972) |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | | 20,835 | 19,768 | 19,330 | 18,491 |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය | | 124,939 | 81,746 | 93,249 | 55,406 |
| භාවිතයට ඇති කල්බදු වත්කම් වල ශුද්ධ ක්ෂය වීම් | | 168,463 | 141,151 | 156,215 | 132,586 |
| කල්බදු ණය හිමියන්ගේ පොලී වියදම් | | 57,989 | 48,317 | 51,061 | 44,593 |
| සේවක ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | | 80,741 | 52,787 | 46,544 | 30,056 |
| උපලබ්ධි වූ ශුද්ධ ලාභ | | 57,224 | (390,099) | (10,415) | (105,376) |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභ/(අලාභ) | | (65,944) | 66,383 | (57,107) | 68,663 |
| දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ දී සිදු වන (ලාභ)/අලාභ | | (2,428) | (966) | (2,280) | (964) |
| භාවිතයට ඇති කල්බදු වත්කම් බැහැර කිරීමේ වාසි | | (1,185) | (1,023) | - | (1,023) |
| | | (4,275,039) | (2,137,696) | (3,741,125) | (1,736,538) |
| මෙහෙයුම් වත්කම්වල ශුද්ධ වෙනස | (අ) | (596,933) | (839,876) | (460,762) | (101,192) |
| මෙහෙයුම් වගකීම්වල ශුද්ධ වෙනස | (ආ) | 7,068,792 | 5,244,791 | 6,887,600 | 4,401,461 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | 2,196,820 | 2,267,219 | 2,685,713 | 2,563,731 |
| පාරිතෝෂික ගෙවීම් | | (46,608) | (17,585) | (21,984) | (12,628) |
| අධිභාර බදු ගෙවීම් | | - | (194,455) | - | (21,966) |
| ආදායම් බදු ගෙවීම් | | (476,948) | (113,892) | (432,160) | (64,079) |
| ප්‍රාග්ධන ලාභ බදු ගෙවීම් | | (4,131) | - | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 1,669,133 | 1,941,287 | 2,231,569 | 2,465,058 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| මූල්‍ය ආයෝජන අත්පත් කර ගැනීම් | | (81,861,946) | (275,166,012) | (63,752,128) | (226,927,326) |
| මූල්‍ය ආයෝජන කල්පිරීමෙන් ලැබෙන ආදායම | | 73,505,256 | 268,513,153 | 56,233,934 | 220,894,080 |
| මූල්‍ය ආයෝජන විකිණීමෙන් ලැබෙන ආදායම | | 2,573,787 | 317,672 | 1,730,628 | - |
| පොලී ලැබීම් | | 5,192,018 | 4,046,819 | 4,521,880 | 3,399,666 |
| ලාභාංශ ලැබීම් | | 7,962 | 8,622 | 7,769 | 111,972 |
| ස්පර්ෂ කළ නොහැකි වත්කම් අත්පත් කර ගැනීම් | | (23,641) | (17,706) | (19,842) | (17,706) |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම් | | (400,564) | (218,654) | (316,334) | (175,547) |
| දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ලැබෙන ආදායම | | 6,762 | 2,501 | 5,011 | 2,053 |
| කල්බදු වත්කම් භාවිත කිරීමේ අයිතිය සඳහා ගෙවූ අත්තිකාරම් | | (42,255) | (18,342) | (30,050) | (17,262) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (1,042,621) | (2,531,947) | (1,619,132) | (2,730,070) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ලාභාංශ ගෙවීම් | | (547,500) | (480,000) | (547,500) | (480,000) |
| කල්බදු වගකීම් සඳහා ගෙවීම් | | (195,045) | (162,654) | (182,987) | (153,830) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල දී භාවිත කරන ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (742,545) | (642,654) | (730,487) | (633,830) |
| මුදල් සහ මුදල් සමානතා වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම (ශුද්ධ බැංකු අයිරා) | | (116,033) | (1,233,314) | (118,050) | (898,842) |
| **වසර ආරම්භයේ මුදල් සහ මුදල් සමානතා (ශුද්ධ බැංකු අයිරා)** | | 767,766 | 2,001,080 | 623,725 | 1,522,567 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමානතා (ශුද්ධ බැංකු අයිරා)** | | 651,733 | 767,766 | 505,675 | 623,725 |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ සටහන්** | | | | | |
| **(අ) මෙහෙයුම් වත්කම්වල වෙනස** | | | | | |
| විලම්භිත වියදම්වල වැඩි වීම | | (44,476) | (6,285) | - | - |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය වල වැඩි වීම | | (21,009) | (17,462) | (21,009) | (17,462) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වල (වැඩි වීම)/අඩු වීම | | (284,839) | 27,888 | (141,034) | 132,760 |
| ලැබිය යුතු රක්ෂණ වාරික වල වැඩි වීම | | (4,737) | (605,673) | (27,393) | (10,725) |
| අනෙකුත් වත්කම්වල වැඩි වීම | | (241,872) | (238,344) | (271,326) | (205,765) |
| **මෙහෙයුම් වත්කම්වල ශුද්ධ වෙනස** | | (596,933) | (839,876) | (460,762) | (101,192) |
| **(ආ) මෙහෙයුම් වගකීම්වල වෙනස් වීම්** | | | | | |
| වෙනත් වගකීම් වැඩි වීම | | 435,452 | 646,052 | 429,498 | 348,111 |
| රක්ෂණ ගිවිසුම් වගකීම් වැඩි වීම - (බදු පෙර) ජීවිත රක්ෂණ | | 6,383,403 | 4,278,892 | 6,383,403 | 4,278,892 |
| රක්ෂණ ගිවිසුම් වගකීම් වැඩි වීම - සාමාන්‍ය රක්ෂණ | | 512,715 | 445,666 | - | - |
| ප්‍රතිරක්‍ෂණ ණය හිමියන්ගේ (අඩුවීම)/වැඩි වීම | | (262,778) | (125,819) | 74,699 | (225,542) |
| **මෙහෙයුම් වගකීම්වල ශුද්ධ වෙනස** | | 7,068,792 | 5,244,791 | 6,887,600 | 4,401,461 |

ඉහත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 214හි ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.